# පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි පුවරු ලිපියේ රාජ වර්ණනයෙහි ඇතුළත් කාව්‍යාත්මක ලක්ෂණ පිළිබඳ විමර්ශනයක්

ඩී. එම්. එම්. එච්. දසනායක

සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

*malishaharuhuna@gmail.com*

***ප්‍රමුඛ පද:*** කාව්‍යාත්මක ලක්ෂණ, ක්‍රි.ව. 10වන සියවස, පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපිය, රාජ වර්ණනාව

## 1. හැඳින්වීම

සෙල්ලිපිවල ආරම්භක අවධියේ සිට දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලෙස සෙල්ලිපිය ආරම්භයේ දී එය කර වූ රජු පිළිබඳ දැක්වෙන රාජ වර්ණනය හඳුනාගත හැකි ය. පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි පුවරු ලිපිය ආරම්භයේ ද දීර්ඝ රාජ වර්ණනයක් දැකිය හැකි ය. මෙම අධ්‍යයනයේ දී එම රාජ වර්ණනයේ අන්තර්ගත කාව්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු වේ. 'කාව්‍යය' යන පදය මුල්කාලීන ව "සාහිත්‍යය" යන්නට පර්යාය පදයක් ලෙස භාවිත වුව ද පසුකාලීන ව පද්‍ය ශානරය සඳහා පමණක් භාවිත විය. ගද්‍ය කාව්‍යයක් ලෙස සෙල්ලිපි නිර්මාණය වුව ද එහි පද්‍ය කාව්‍ය ලක්ෂණ ද ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි සෙල්ලිපිය ආරම්භයේ සඳහන් රාජ වර්ණනයේ දැකිය හැකි කාව්‍යාත්මක ලක්ෂණ විමසා බැලීමයි. අර්ථාලංකාර, ශබ්දාලංකාර, විරිත් භාවිතය හා රස සංකල්පය වශයෙන් කාව්‍යාත්මක ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමට මෙමගින් අපේක්ෂිත ය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ, "පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි පුවරු ලිපිය ආරම්භයේ සඳහන් රාජ වර්ණනයේ අන්තර්ගත පද්‍ය කාව්‍යාත්මක ලක්ෂණ මොනවා ද යන්න විමසා බැලීමයි. සෙල්ලිපි මාධ්‍ය භාවිත වන අතරතුරෙහි ම බිහි වන අමාවතුර, බුත්සරණ ආදි ගද්‍ය කෘතිවල කාව්‍යාත්මක ලක්ෂණ පිළිබඳ විවිධ අධ්‍යයන සිදු වුව ද සෙල්ලිපි බස් වහර සම්බන්ධයෙන් එවැනි අධ්‍යයන සිදු ව ඇත්තේ අල්ප වශයෙනි. මේ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ සීමාව වන්නේ පස්වන කාශ්‍යප රජුගේ අභයගිරිය සෙල්ලිපියේ ආරම්භක රාජ වර්ණනයෙන් පිළිබිඹු වන කාව්‍ය ලක්ෂණ පිළිබඳ විමසා බැලීම පමණි.

## 2. සාහිත්‍ය විමර්ශනය

පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි පුවරු ලිපිය කේන්ද්‍ර කරගෙන සිදු කර ඇති පූර්ව අධ්‍යයන අතරින් කිහිපයක් පිළිබඳ විමසා බලන ලදී. කොත්මලේ අමරවංශ හිමි (1969) මුල් අවධියේ සිට ම නිර්මාණය වී ඇති සෙල්ලිපි පිළිබඳ විමර්ශනයක් කරයි. මෙහි දී අභයගිරි පුවරු ලිපියෙහි අක්ෂර, භාෂාව හා ශෛලිය පිළිබඳ සාකච්ඡා වී ඇතත් කාව්‍යාත්මක බස් වහර පිළිබඳ අවධානය යොමු වී නොමැත. නන්දසේන මුදියන්සේ (2000) විසින් අභයගිරි පුවරු ලිපියට අරුත් විවරණ සැපයීම පමණක් සිදු කරන ලදි. විමලකිත්ති (2004) සහ සිල්වා (2000) ද අභයගිරි සෙල්ලිපියට අරුත් විවරණ සැපයීමේ දී පැහැදිලි ව උපමා සහ රූපකාදිය නිරූපණය කර ඇතත් කාව්‍යාත්මක රීතිය පිළිබඳ අවධානය යොමු කොට නොමැත. බණ්ඩාර (2018) සෙල්ලිපිවල නාම විශේෂණ සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කර ඇත. පඤ්ඤාසාර හිමි සහ මල්ලව ආරච්චි (2009) කර ඇත්තේ අභයගිරි පුවරු ලිපිය පිළිබඳ අරුත් විවරණ සැපයීමක් පමණි. ජයසේකර (1962) මුල් කාලීන සෙල්ලිපිවලට පමණක් සීමා වී විමර්ශනයක් සිදු කොට ඇත. මෙම පූර්ව අධ්‍යයන විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ

පස්වන කාශ්‍යප රජුගේ අභයගිරිය සෙල්ලිපියෙහි භාෂාත්මක හා සාහිත්‍යාත්මක ලක්ෂණ හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇතත් එහි ආරම්භක රාජ වර්ණනයෙහි ඇති කාව්‍යාත්මක ලක්ෂණ පිළිබඳ පුළුල් විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැති බවයි. මෙම අධ්‍යයනයේ දී එම පර්යේෂණ හිඩැස පිරවීමට අපේක්ෂා කෙරෙයි.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා පුස්තකාලය සමීක්ෂණ ඇසුරින් සකසා ගන්නා ලද ප්‍රාථමික සහ ද්විතීයික දත්ත ද අන්තර්ජාලය ඇසුරින් ලබා ගන්නා ලද දත්ත ද යොදා ගන්නා ලදී. ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කරනු ලැබේ. සෙල්ලිපිවල භාෂාවෙහි ඇතුළත් කාව්‍යාත්මක ලක්ෂණ පිළිබඳ විමසීමේ දී සෙල්ලිපි පිළිබඳ එහි මුල් ස්වරූපයෙන් විමසා බැලීම අත්‍යවශ්‍ය නොවේ. වඩාත් යෝග්‍ය ක්‍රමවේදය වන්නේ ඒ ඇසුරෙන් රචනා වූ පසුකාලීන සාහිත්‍ය මූලාශ්‍රය විමසා බැලීමයි. සෙල්ලිපි හා එහි බස සම්බන්ධයෙන් රචනා වී ඇති ප්‍රධාන ග්‍රන්ථ කිහිපයක් දැකිය හැකි අතර මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස එම ග්‍රන්ථ පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු කරන ලදී.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡාව

ක්‍රි.ව. 10 වන සියවසට අයත් පස්වන කාශ්‍යප රජුගේ අභයගිරිය පුවරු ලිපිය, අනුරාධපුර අභයගිරි විහාර භූමියට ආසන්න ප්‍රදේශයකින් සොයා ගන්නා ලද්දකි. මෙහි උස අඩි 5යි අඟල් 4ක් ද, පළල අඩි 3යි අඟල් 3ක් ද වෙයි. පුවරු ලිපියේ ආරම්භක රාජ වර්ණනයෙහි අන්තර්ගත පද්‍ය කාව්‍යාත්මක ලක්ෂණ අර්ථාලංකාර හා ශබ්දාලංකාර වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. අර්ථාලංකාර පිළිබඳ සැලකීමේ දී ලිපියෙහි 1-2 පේළි මුළුමනින් ම රූපකාලංකාරවලින් සමන්විත බව දක්නට ලැබෙයි. එම රූපක අදාළ කාරණයට යෝග්‍ය ලෙස ඖචිත්‍යතාව රකිමින් අන්තර්ගත කොට ඇත. රූපකවලින් සමන්විත අඛණ්ඩත්වය 2 වන පේළියෙන් අනතුරු ව ඛණ්ඩනය වන නමුත් රාජ වර්ණනය අතරතුර ද තවත් රූපක දැකිය හැකි ය. උපමාලංකාරය ද අභයගිරිය පුවරු ලිපිය ආරම්භයේ සඳහන් රාජ වර්ණනයෙහි දැකිය හැකි ය. අතිශයෝක්ති අලංකාරය සහිත ප්‍රශස්ති ලක්ෂණ ඇතුළත් වර්ණනාත්මක භාෂා ශෛලිය මෙහි දැකිය හැකි තවත් විශේෂ ලක්ෂණයකි. මෙය සංස්කෘතයේ දැකිය හැකි වර්ණනාත්මක ශෛලියට සමාන ය. පළමු වන පේළියෙන් ඇරඹෙන රාජ වර්ණනය අවසාන වන්නේ දහහතර වන පේළියෙනි. එතෙක් කිසිදු නැවතීමකින් තොර ව අඛණ්ඩ ව පස්වන කාශ්‍යප රජු පිළිබඳ වර්ණනා කරනු ලබයි. අනවරතයෙන් භාෂාව ගලා යාමට සලස්වන දිගු වැකි භාවිතය ද කාව්‍යාත්මක බස් වහරේ ලක්ෂණයකි. දිගු වැකිවල 'ඇ'කාරාන්ත හා හලන්ත භාවිතය හේතුවෙන් ඇති වූ අනුප්‍රාසාත්මක බව ද වෙයි. ආරම්භක රාජ වර්ණනයේ ඇතැම් ස්ථානයක වෘත්ත ගන්ධි ශෛලිය දැකිය හැකි අතර ම වෘත්ත ගන්ධි ශෛලියට සමාන ව බස් වහර හැසිරවීම බොහෝ ස්ථානවල දැකිය හැකි ය. මෙකී ශෛලිය හා අනුප්‍රාසාත්මක බව බසෙහි ලලිත බවක් හා පද ගැටීමේ මිහිරියාව නිර්මාණයට ද හේතු වී ඇත. උක්ත අර්ථාලංකාර හා ශබ්දාලංකාරවල සුසංයෝගය අවසාන වශයෙන් වීර රසයක් උත්පාදනය කරන අයුරු හඳුනාගත හැකි ය.

## 5. නිගමන සහ යෝජනා

පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි පුවරු ලිපියෙහි ආරම්භක රාජ වර්ණනයෙන් කාව්‍යාත්මක ලක්ෂණ රැසක් විද්‍යමාන වන බව පැහැදිලි ය. තත්කාලීන සෙල්ලිපිවල ආරම්භයේ දී අනිවාර්ය අංගයක් ලෙස දැකිය හැකි රාජ වර්ණනය වන්දිභට්ට කාර්යයක් සිදු කළ බව ද සිතිය හැකි ය. එසේ ම රජවරුන් ස්වකීය ප්‍රසිද්ධිය උදෙසා වර්ණනාත්මක ශෛලියකින් මෙවැන්නක් සෙල්ලිපිය ආරම්භයෙහි අන්තර්ගත කිරීමට උපදෙස් දීමක් සිදුවන්නට ද ඇත.

අභයගිරි පුවරු ලිපියෙහි සාම්ප්‍රදායික උපමා සහ රූපක භාවිතයක් දැකිය හැකි වුව ද අදාළ කරුණු සමග ඒවායෙහි මනා යෝග්‍යතාවක් පවතින අයුරු ද දැකිය හැකි ය. සෙල්ලිපිවල භාවිත සුවිශේෂ පද සංඝටනාව කාශ්‍යප පුවරු ලිපියෙහි ද දැකිය හැකි අතර අනුප්‍රාසය නිසා උපදින ශබ්ද රසය ද දැකිය හැකි ය. එහෙයින් සිංහලයේ මුල්කාලීන යුගවල ලේඛකයාට පවා කාව්‍යමය අර්ථාලංකාර හා ශබ්දාලංකාර භාවිතයෙහි මනා අවබෝධයක් ලේඛකයාට තිබී ඇති බව පැහැදිලි ය. සංස්කෘත වර්ණනාත්මක ශෛලිය පසුකාලීන ග්‍රන්ථවලට පිවිසීමට පෙර සෙල්ලිපි බසට පිවිස ඇති ආකාරය ද පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපිය විමසීමේ දී දැකිය හැකි ය. මේ සියලු කරුණු විමසීමේ දී පැහැදිලි වන්නේ සිංහල භාෂාවෙහි මුල් යුගවල පටන් බස කාව්‍යමය අරුතකින් වහරන්නට ලේඛකයා පෙලඹ සිටි බවයි. එකල ජනයා කාව්‍යාත්මක බස් වහරට ප්‍රමුඛ ස්ථානයක් දී ඇති බව ද වැඩි දුරටත් පැහැදිලි වෙයි. පාඨකයන් අවම වූ ශ්‍රාවකයන් බහුල සමාජයකට වඩාත් උචිත වන්නේ ද කාව්‍යාත්මක බස් වහරයි.

## 6. ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය


ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි සහ නිමල් මල්ලව ආරච්චි. (2009). *සිංහල භාෂා විකාශය සහ ශිලාලේඛන විමර්ශනය*. සංස්. කැලණියඃ කර්තෘ ප්‍රකාශන.

ජයසේකර, යූ. ඩී. (1962). *ගී කවේ වගතුග*. කොළඹඃ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

*ලක්දිව සෙල්ලිපි* කොත්මලේ අමරවංශ හිමි (සංස්). 1969.කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දූරණියගල, එස්. යූ., කරුණාරත්න, සද්ධාමංගල සහ ද සිල්වා, වික්‍රමසිංහ දොන් මර්තිනු (2000). *ශිලාලේඛන සංග්‍රහය*. කොළඹඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බණ්ඩාර, මිහිර. (2018). *සිංහල ශිලා ලේඛන මගින් හෙළි වන නාම විශේෂණ භාවිතය.* සාහිත්‍යය විශේෂ කලාපය. බත්තරමුල්ලඃ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.